


# දුආ ඉබාදතයකි

"දුආ" යන වචනය ඉල්ලීම, අයැදීම, කැඳවීම යන විවිධ අර්ථ ගෙන දෙන්නේ ය. ගැත්තා තම අවශ්‍යතා සඳහා ප්‍රාර්ථනා කිරීම මෙයින් අදහස් කෙරේ. මෙය වැදගත් නැමදුමකි. නැමඳුම්වලින් ප්‍රමුඛ වනුයේ දුආ බව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා පවසා ඇත.

අල්ලාහ් අප කෙරෙහි නියම කර ඇති මූලික නැමදුම් පවා අල්ලාහ් හා ගැත්තා අතර සමීප බව ඇති කර අල්ලාහ් කෙරෙහි දෑත් දිගු කිරීමට අවස්ථාව ඇති කරන්නේ ය.

අල්ලාහ්ගේ මැවුම්වලින් ඔහුට ඉතා ම ශ්‍රේෂ්ට අය වන්නේ රසූල්වරු සහ නබිවරු ය. මේ අය ද තම ජීවිතයේ සියලු අවස්ථාවල අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන අය වූහ. අල්ලාහ් මේ අයගේ ප්‍රාර්ථනා අපට පූර්ව උදහරණ වශයෙන් ගෙන හැර දක්වයි.

ආදම් අලෛහිස්සලාම් තුමා **"එම දෙදෙනාම අපගේ 'රබ්'! අපි අපටම අපරාධ කරගත්තෙමු. නුඹ අපිට ක්ෂමා කර අප කෙරෙහි දයාදය පහළ නොකළේ නම් නියතව අපි පාඩු වූවන්ගෙන් එක් වන්නෙමු"** යි එම දෙදෙනාම (ප්‍රාර්ථනා කරමින්) පසුවූහ. (7:23)

නූහ් අලෛහිස්සලාම් තුමා **"හිමියාණෙනි, මා හා මාගේ දෙමාපියන් ඔබ විශ්වාස කළ ආකාරයෙන්ම මාගේ නිවසට පැමිණි අය ද තව ද මුඃමින් වූ පිරිමින්, මුඃමින් වූ ගැහැනුන් ද කමා කරනු මැනැවි. අපරාධකරුවන්ට විනාශය ගෙන දෙනු මැනැවි.** (71: 28) යනුවෙන් අසනු ලදි.

ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමා, **"දෙවියනි, අප පිළිගනු මැනැවි. දෙවියනි අප දෙදෙනා (ඉස්මාඊල් අලෛහිස්සලාම් ) ඔබට යටහත් පහත් වූවන් කරනු මැනැවි. අපගේ පරම්පරාව අවනත වූ මුස්ලිම් සමාජයක් බවට පත් කරනු මැනැවි. අප කළ යුතු කාර්යයන් අපහට පෙන්වා දෙනු මැනැවි. අපට සමාව දෙනු මැනවි. සමාව දෙන්නාත් කරුණාවන්තයාත් ඔබ ය."** (2: 125) යනුවෙන් අසන ලදි.

මූසා අලයිහිස්සලාම් තුමා **"හිමියනි මගේ සිත පුළුල් කර දෙනු මැනවි. මාගේ කාර්යයන් පහසු කර දෙනු මැනවි. ජනතාවට මගේ කතා පැහැදිලිව ඇසෙන අයුරින් මගේ දිවෙහි ඇති බාධාව ඉවත් කරනු මැනවි.** යනුවෙන් අසන ලදී. (20: 25-28)

නබි මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා සියලු ම කටයුතු ප්‍රාර්ථනා සමඟ ආරම්භ කර අවසන් කරනුයේ ද ප්‍රාර්ථනාව සමඟ ය. එතුමාණෝ ප්‍රාර්ථනා කරන අවස්ථාවල දී හඬා වැළපෙති. තම නොහැකියාව සහ ගැති බව මුළුමනින් ම ප්‍රකාශ කර සිටිති. තායිෆ් නගරයේ සිට ආපසු එන විට ද බද්ර් යුද්ධයේ ද ඇසූ ප්‍රාර්ථනා මෙයට හොඳ ම උදාහරණය වන්නේ ය.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ප්‍රාර්ථනා කිරීමේ වැදගත්කම ගැන අවධාරණය කළහ.

"කවුරුන් අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා නොකරයි ද ඔහු සමඟ අල්ලාහ් අමනාප වන්නේ ය." (ඉබ්නු මාජා)

"ප්‍රාර්ථනාව මුඃමින්ගේ ආයුධය වේ." (හාකිම්)

"සියල්ලන්ට ම වඩා දුර්වල තැනැත්තා ප්‍රාර්ථනා නොකරන දුර්වල තැනත්තා ය." (තබරානි)

ඉහත සඳහන් ආදර්ශයන්ට හා උපදෙස්වලට අනුව ඔබ අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන්නේ නම් ඔබට හෝ ඔබගේ නෑයෙකුට දුකක් ඇති වන විට, රෝගයක් ඇති විට ඔබ තරගවලට සහභාගි වන විට, විභාගවලට මුහුණ දෙන විට, අනතුරුවලට ලක්වන විට, අවශ්‍යතා ඇති වන විට ඔබ ප්‍රාර්ථනා කරනවා ද?

ඔබගේ ප්‍රාර්ථනාවන් පිළිගනු නොලැබූ අවස්ථා ඔබ දැන තිබෙනවා ද? ඒවා ඔබට මතක් කර බැලිය හැකි ද?

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා මෙසේ කීවේ ය.

කිසිවෙකුට අපරාධයක් සිදුවීමට ප්‍රාර්ථනා නොකරන, පවුලක් භේද කිරීමට ප්‍රාර්ථනා නොකරන, ඕනෑම මුස්ලිම්වරයකුගේ ප්‍රාර්ථනාව අල්ලාහ් ඉටු කරන්නේ ය. එය පහත ආකාර තුනෙන් ඕනෑම ආකාරයකට ඉටු වෙයි.

1. පැතූ දෙය මෙලොවෙහි ම ලැබෙන්නේ ය.

2. කියාමාවේ දී ලබා දීම සඳහා පමා කරයි.

3. ඉල්ලා සිටි හානියකට සමාන හානියක් ඉවත් කරයි.

මෙය කන වැටුණු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා සහාබිවරුන් අප වැඩියෙන් ප්‍රාර්ථනා කළේ නම් කී විට, නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා අල්ලාහ් වෙත ඉතාමත් වැඩියෙන් ඇත යැයි පිළිතුරු දුන්හ. (තිර්මිදි)

අපගේ යුතුකම අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කිරීමයි ඔහු කැමැත්තේ නම් අපගේ පැතුම වහා අනුමත කරයි නැතහොත් කල් දමයි. නැතහොත් මෙලොවෙහි දී නොදී සිටියි. ප්‍රාර්ථනාවේ ප්‍රතිඵලය අප නොදකින විට ද ප්‍රාර්ථනාව නොකර නොසිටිය යුතු ය. සැබැවින්ම අල්ලාහ් එහි කිසියම් යහපතක් ලබා දිය හැකි ය, යන විශ්වාසය අප සතු විය යුතු ය.

ප්‍රාර්ථනාවල දී පහත අනුපිළිවෙළ අනුගමනය කිරීම නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ මාර්ගය යි.

1. වුලූඃ සමඟ ප්‍රාර්ථනා කිරීම

2. කිබ්ලාව පෙරටු කොට ශබ්දය පහත් කොට ප්‍රාර්ථනා කිරීම

3. දුආව හම්දු සලවාත සමඟ ආරම්භ කර අවසන් කිරීම

4. දෑත් ඔසවා චිත්ත පාරිශුද්ධතාව, අවනත බව, බලාපොරොත්තුව, ආදිය සමඟ ප්‍රාර්ථනා කිරීම

5. ප්‍රාර්ථනයට කලින් කුසලයන්හි යෙදීම සහ කුසලයන් ඉදිරිපත් කිරීම

6. ඉල්ලන කරුණ තෙවරක් ඉල්ලීම

7. අල් කුර්ආනයේ හා හදීසයේ දක්වා ඇති දුආ පෙරටු කොට ගෙන ප්‍රාර්ථනා කිරීම

8. අල්ලාහ්ගේ ශුද්ධ වූ නාමය ඉදිරිපත් කර ප්‍රාර්ථනා කිරීම

9. ප්‍රාර්ථනාව සඳහා ඉතාමත් සුදුසු කාල වෙලාවන් භාවිත කර ගැනීම,

උදාඃ-

- පසු රාත්‍රි කාලවල
- සිකුරාදා දිනවල
- රමළාන් මාසයේ
- අරෆා දිනයේ

10. ඉතාමත් හොඳ අවස්ථා භාවිත කිරීම,

උදාඃ-

- වහින අවස්ථාවල
- අදානය සහ ඉකාමතය අතර
- සච්මය අවසන් කරන අවස්ථාවක
- සුජූදයේ දී
- ගමනක දී

## 1 අල් කුර්ආනේ ඇති දුආ කිහිපයක්

رَبَّنَا آتِنَا فِي الدُّنْيَا حَسَنَةً وَفِي الآخِرَةِ حَسَنَةً وَقِنَا عَذَابَ النَّارِ

අපගේ රබ් (පරමාධිපති) මෙලොවදිත් අපට ප්‍රශස්ත දේ දෙන්න. පරලොවදීත් අපට ප්‍රශස්ත දේ දෙන්න. තව ද අප අපායග්නියෙන් මුදවා ගනු මැනවයි (2:201)

رَبَّنَا أَفْرِغْ عَلَيْنَا صَبْرًا وَتَوَفَّنَا مُسْلِمِينَ

අපගේ රබ් (පරමාධිපතියාණනි!) අප වෙත ඉවසීම (ගුණාංග) වර්ධනය කරන්න. අපව මුස්ලිම්වරුන් (අවනතවූවන්) මෙන් මරණයට පත් කරන්නැයි. (7: 126)

## 2 අල් හදීස්වල දක්වා ඇති දුආ කිහිපයක්

උදා

මස්ජිදයට ඇතුළුවන විට

اللَّهُمَّ افْتَحْ لِي أَبْوَابَ رَحْمَتِكَ

'දෙවිඳුනේ ඔබගේ දායාද දොරටුව මාවෙනුවෙන් විවෘත කරනු' (මුස්ලිම්)

අසනීපයෙන් පෙළෙන අය බලන්නට ගිය විට

اللَّهُمَّ رَبَّ النَّاسِ مُذْهِبَ الْبَاسِ اشْفِ أَنْتَ الشَّافِي لَا شَافِيَ إِلَّا أَنْتَ شِفَاءً لَا يُغَادِرُ سَقَمًا

දෙවිඳුනේ මිනිසුන්ගේ අධිපතිඳුණි, දුෂ්කරතා නැති කරන්නා නුඹ සුව කරනු. නුඹමය සුව කරන්නා නුඹ හැර සුව කරන්නට වෙන කිසිවකු නැත.රෝගය හිඟ නොතබා මුළු මනින්ම සුවකරනු. (බුහාරි)

පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

دُعَاءٌ عِبَادَةٌ حَمْدٌ صَلَوَاتٌ قِبْلَةٌ

### අභ්‍යාස

1. දුආ යන පදයේ භාෂාමය තේරුම කුමක් ද?
2. දුආහි වැදගත්කම අවධාරණය කරන හදීස් දෙකක් ලියන්න.
3. අල්ලාහ් අපගේ දුආවලට කෙසේ පිළිතුරු දෙන්නේ ද යන්න සඳහන් කරන්න.
4. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා තායිෆ්වල සිට පැමිණෙන විට කළ දුආව සොයා බලා ලියන්න.

### ක්‍රියාකාරකම

අල් කුර්ආනයෙන් සහ හදීස්වලින් දුආ පහ බැගින් රැස් කර පොත් පිංචක් සකස් කරන්න.